## නවගත්තේගම ප්‍රාදේශීය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 08 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 12 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 31 දින සභාපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.15,755,586ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,531,935ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.603,601ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 06කට අදාල පාලන ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.10,760,261ක් වූ අතර , උපයෝගි ලේඛනය අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.11,667,840ක් විය.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,951,283ක් වූ අතර, අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.377,240ක් විය.

(ඇ) සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරීවරයාගේ අනුමැතිය රහිතව සිදුකල ගෙවීම්වල වටිනාකම රු.968,120ක් විය.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,623,617ක් වූ අතර, අවුරුදු 01ක කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.11,875ක් විය.

(ඉ) 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.493,290ක් වූ අතර, අවුරුද්දක් ඉක්මවා ඇති සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.285,221ක් විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | - | - | - |
| (ii) | බදුකුලී | 578 | 566 | 12 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 182 | 173 | 09 |
| (iv) | වෙනත් ආදායම් | 4,316 | 4,316 | - |

## 2.3.2 උසාවි දඩ

----------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දින ලැබිය යුතුව තිබූ උසාවි දඩ මුදල් රු.577,769ක් විය.

## 2.4 නිෂ්ක්‍රිය භෞතික සම්පත්

------------------------

පැරණි ජල යෝජනා ක්‍රමයට අයත් රු.750,000ක් වටිනා වත්කම් වසර 05කටත් වැඩි කාලයක්ද, වටිනාකම රු.332,500ක් වූ මිනි කුබෝටා ට්‍රැක්ටරය හා ට්‍රේලරය වසර ගණනාවක්ද නිෂ්කාර්යව තිබුණි.

## 2.5 කාර්ය සාධනය

---------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂය තුළදී ස්වයං උත්පාදිත ආදායම් වලින් සභාව උපයා ඇති ආදායම්වල එකතුව රු.1,530,003ක් වූ අතර, එයින් ප්‍රතිපූර්ණය කල වැටුප් හැර ඉතිරි වැටුප් සඳහා හා සභාවේ අනිවාර්ය වියදම් සඳහා වන වැය රු.1,131,458ක් විය. මෙම අනිවාර්ය වැයවල ඇතුළත් ඉන්ධන වියදම් හා අළුත්වැඩියා වියදම් රු.685,242ක් සභා ස්වයං උත්පාදිත ආදායම් හා සසඳන කල 45%ක් තරම් ඉහළ ප්‍රතිශතයකි. මුළු ඉන්ධන හා අළුත්වැඩියා වියදමින් 55%ක් සභාපතිවරයාගේ නිළ වාහනය සඳහා යොදන ලද ඉන්ධන වියදම් විය.

(ආ) 2011 වාර්ෂිකව ක්‍රියාත්මක සංවර්ධන සැලැස්මට අනුව ඉටු කිරීමට අපේක්ෂිත වූ පළාත් නිශ්චිත කර්මාන්ත හා තථ්‍ය වශයෙන් ඉටුකල කර්මාන්ත පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| ප්‍රතිපාදිත මූලාශය | අයවැයගත | | තථ්‍ය | |
|---|---|---|---|---|
| | කර්මාන්ත සංඛ්‍යාව | වියදම රු.මිලියන | කර්මාන්ත සංඛ්‍යාව | වියදම රු.මිලියන |
| පළාත් නිශ්චිත | 11 | 8.4 | 02 | 1.1 |
| විශේෂ ව්‍යාපෘති | 10 | 416.0 | 09 | 4.0 |
| | 21 | 424.4 | 11 | 5.1 |

ඒ අනුව වාර්ෂික සංවර්ධන සැලැස්මෙහි අඩංගු වූ සංවර්ධන යෝජනාවලින් ඉටුකල වැඩවල ප්‍රතිශතය 42%ක තරම් අඩු මට්ටමක පැවතුණි. මූළ ප්‍රාග්ධන වැය ඇස්තමේන්තුව හා සසඳන කල සත්‍ය ප්‍රාග්ධන වියදම 0.14%ක් තරම් අඩු ප්‍රතිශතයක් විය.

(ඈ) සභාවේ ආදායම් ප්‍රභවයන් අතුරින් 2011 වර්ෂය සඳහා වන ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු නොකිරීමත් , වර්ෂ 06කට අධික කාලයක් තිස්සේ නිශ්කාර්යව පවතින රු.750,000ක් වටිනා ජල ව්‍යාපෘති නඟාසිටුවීමට උත්සහා දරා නොතිබීමත් , දිගින් දිගටම හිඟව පවතින පැරණි පුස්තකාල ගොඩනැගිල්ලේ හිඟ කුලී වටිනාකම වූ රු.21,000ක් අයකර ගැනීමට කටයුත නොකිර්මත් යන කාරණා මත සභා ආදායම් පහළ බැසීම හා නව ආදායම් උත්පාදනයන් කෙරෙහි ප්‍රමාණාත්මක උත්සහායක් දරා නොතිබීමත් හේතුවෙන් සභාවේ අනිවාර්ය වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායම් උත්පාදනයන් කෙරෙහි උනන්දු වීමක් ද දක්නට නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් සකස්කර තිබුණ ද එම සැළැස්ම නියමානුකුල අන්දමින් සකස් කර ඉටු කිර්ම් මට්ටම ඇගයිමකට ලක්කර නොතිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3 පද්ධති හා පාලන

-----------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය

(ආ) ආදායම් පර්පාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ගබඩා පාලනය